සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**16 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

| | | |
|---|---|---|
| **ඉස්ලාම්** | **I, II** | **පැය තුනයි** |
| இஸ்லாம் | **I, II** | மூன்று மணித்தியாலம் |
| Islam | **I, II** | *Three hours* |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ඉස්ලාම් I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස මෙලොව පාලනය කිරීමේ වගකීම හඳුන්වන්නේ කෙසේ ද?
(1) ඉබාදත් (2) ඉමාරත් (3) කිලාෆත් (4) රිසාලත්

**2.** නබි මූසා (අලෙ) තුමාට පහළ කරන ලද සුහුෆ්හි සංඛ්‍යාව කීයද?
(1) 10 (2) 20 (3) 30 (4) 50

**3.** සලාතයේ "සමිඅල්ලාහු ලිමන් හමිදා" යනුවෙන් පරායණය කරනු ලබන්නේ කුමන අවස්ථාවේ ද?
(1) රුකූඋ කිරීමේ දී (2) රුකූඋ සිට නැගිට ඉඃතිදාලයට පැමිණීමේ දී
(3) සජ්දා කිරීමේ දී (4) මැද ඉඳුමට පැමිණීමේ දී

**4.** නබි මුහම්මද් (සල්) තුමාගේ සහ සහබිවරුන්ගේ (මිත්‍රවරුන්) ජීවන ක්‍රමය අනුගමනය කරන්නන් හඳුන්වන්නේ කෙසේ ද?
(1) කාදියානි ලෙස (2) මුඃතසිලා ලෙස
(3) අහ්ලුස් සුන්නා වල් ජමාආ ලෙස (4) ශීආ ලෙස

**5.** පරලොව ජීවිතය සම්බන්ධ කරුණු අඩංගු වන කොටස විද්වතුන් හඳුන්වන්නේ කෙසේ ද?
(1) අල් ඉලාහියියාත් ලෙස (2) අන් නුබුව්වාත් ලෙස
(3) අර් රූහානියියාත් ලෙස (4) අස් සම්ඉයියාත් ලෙස

**6.** ඉස්ලාම් මූලධර්මවලට අනුව සමාජයට අවශ්‍ය නාරිවේද (විශේෂඥ) වෛද්‍යවරියන් බිහිවීමට මගපෑදීම හඳුන්වන්නේ,
(1) ෆර්ල් අයින් ලෙස ය. (2) ෆර්ල් කිෆායා ලෙස ය. (3) මක්රූහ් ලෙස ය. (4) සුන්නත් ලෙස ය.

**7.** පහත ඒවායින් අල්-මාඋත් තහූර් ජලය **නොවන්නේ,**
(1) මුහුදු ජලයයි. (2) උල්පත් ජලයයි. (3) තැඹිලි වතුරයි. (4) වැසි ජලයයි.

**8.** මුඃමින්වරයකු හා කාෆිර්වරයකු අතර තිබෙන වෙනස ලෙස නබි (සල්) තුමා සඳහන් කරනු ලැබුවේ කුමක් ද?
(1) සලාතය අතහැරීම
(2) උපවාසය නොකිරීම
(3) ඉටුකිරීමට තරම් පහසුකම් තිබියදීත් හජ් ඉටු නොකිරීම
(4) කුහකකමෙන් හැසිරීම

**9.** සුබ්හු යන සලාතයන්ට පසුව මුහම්මද් (සල්) තුමා කී වරක් "කලිමතුත් තව්හීද්" පරායණය කළේ ද?
(1) 03 (2) 07 (3) 10 (4) 33

[දෙවැනි පිටුව බලන්න.

10. 'චිත්ත පාරිශුද්ධිය' යන අර්ථය ගම්‍ය වන පදය කුමක් ද?
(1) අත්තහාරත් (2) තස්කියතුන් නෆ්ස් (3) නෆ්සුල් ලව්වාමා (4) නෆ්සුල් මුත්මඉන්නා

11. කාන්තාවක් නිසි ලෙස සලාතය ඉටු කරලත්, පූසෙකුට ආහාර නොදී බැඳ තැබීම හේතුවෙන් අපාගත වූ බව පවසන සිද්ධිය
(1) අල්කුර්ආනයේ සඳහන් වන්නකි. (2) නබි (සල්) තුමා පවසන ලද්දකි.
(3) කලීෆාවරයකුගේ ප්‍රකාශයකි. (4) ප්‍රසිද්ධ ඉස්ලාමීය විද්වතකුගේ ප්‍රකාශයකි.

12. මෙලොව අනිත්‍ය බව පෙන්වාදෙන ඉස්ලාමීය වාක්‍යාංශය වන්නේ,
(1) දාරුල් බකා ය. (2) දාරුල් ෆනා ය. (3) දාරුස් සලාම් ය. (4) දාරුල් හික්මා ය.

13. මුජ්තහිද්වරුන් 'පැහැදිලි ඉජ්මාඋ' හඳුන්වන්නේ කෙසේ ද?
(1) ඉජ්මාඋල් අක්සරියියා ලෙස (2) ඉජ්මාඋස් සුකුති ලෙස
(3) ඉජ්මාඋස් සරීහ් ලෙස (4) ඉජ්මාඋල් අරබ් ලෙස

14. කුල්ලතෙන්ට වඩා අඩු ජලයේ නජීසයක් වැටී ඇත. නමුත් එහි රස, වර්ණය හා සුවඳ වැනි ගුණාංග කිසිසේත් වෙනස් නොවේ නම්, එම ජලය වුළු කිරීමට
(1) සාමාන්‍යයෙන් භාවිත කළ හැකි ය.
(2) භාවිත නොකළ යුතු ය.
(3) භාවිත නොකිරීම උචිත ය.
(4) නොවැළැක්විය හැකි අවස්ථාවක පමණක් භාවිත කළ හැකි ය.

15. 'වහි' යන පදයට අර්ථයක් **නොවන්නේ**,
(1) සිතුවිලි ඇතිවීමයි. (2) රහසිගත කථනයයි.
(3) පණිවිඩ පැවසීමයි. (4) මෘදු ලෙස කතා කිරීමයි.

16. තයම්මුම්හි අංග වන්නේ,
(1) මුහුණ හා දෑත් ය. (2) මුහුණ හා දෙපා ය.
(3) මුහුණ හා ඔළුව ය. (4) මුහුණ, ඔළුව හා දෑත් ය.

17. කුරෙෂිවරුන්ගේ කෲර ක්‍රියා දරාගත නොහැකි වීම හේතුවෙන් නබි (සල්) තුමා තම මිතුරන් ප්‍රථමවරට පිටමං (හිජ්රත්) කර යැවූ ප්‍රදේශය කුමක් ද?
(1) හබෂා (2) මදීනා (3) තායිෆ් (4) යෙමන්

18. පහත සඳහන් වන අයගෙන් පුරුෂයකුට විවාහ කිරීමට අනුමැතිය ඇති ස්ත්‍රිය වන්නේ,
(1) පියාගේ සහෝදරයාගේ දුවයි. (2) කිරි නෑකමේ සහෝදරියයි.
(3) කිරි නෑකමේ සහෝදරියගේ දුවයි. (4) පියාගේ බිරිඳගේ දුවයි.

19. නබි (සල්) තුමා සිදුවීම් පහක් සිදුවීමට පෙර ඇති අවස්ථා පහක් උපයෝගී කරගනු මැනවි යැයි පැවසී ය. එයින් එකක් වනුයේ,
(1) සවස්වරුව උදාවීමට පෙර උදය කාලය උපයෝගී කර ගැනීමයි.
(2) රෝගාතුර වීමට පෙර නීරෝගිකම උපයෝගී කර ගැනීමයි.
(3) දුකක් ඇති වීමට පෙර සතුට විඳීම උපයෝගී කර ගැනීමයි.
(4) සතුරුකමක් ඇති වීමට පෙර සම්බන්ධතාවය උපයෝගී කර ගැනීමයි.

20. ඇතැම් අවස්ථාවල දී නබි (සල්) තුමාගේ මිත්‍රයකුගේ උපදෙස්වලට අනුව ද අල්-කුර්ආන් වැකි (වහි) පහළ විය. එම මිත්‍ර සහාබිවරයා කවුරුන් ද?
(1) අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රලි) (2) සෙයිද් ඉබ්නු තාබිත් (රලි)
(3) උමර් ඉබ්නුල් කත්තාබ් (රලි) (4) අලී ඉබ්නු අබී තාලිබ් (රලි)

21. අල්-කුර්ආන් අක්ෂර සඳහා පිල්ලම් යෙදූ සුප්‍රසිද්ධ අරාබි භාෂා ව්‍යාකරණ විද්වතා කවුරුන් ද?
(1) කලීල් ඉබ්නු අහ්මද් අල්ෆරාහීදි (2) ඉමාම් සීබවෙහි
(3) අබුල් අස්වද් අද්දුඅලි (4) අබුල් කාසිම් මහ්මූද් අස්-සමහ්ෂරී

22. ඉස්ලාම් දහම බිහිවීමටත් පෙර අරාබිවරුන් තම ජාත්‍යන්තර වෙළෙඳ කටයුතුවල නියැලීමේ දී ශ්‍රී ලංකාව කේන්ද්‍රස්ථානයක් ලෙස සැලකීමට හේතුව කුමක් ද?
(1) ශ්‍රී ලංකාව තනි දූපතක් වීම
(2) අරාබිවරුන්ට සිංහල රජවරු සමග සබඳතා තිබීම
(3) ශ්‍රී ලංකාව සංචාරක කේන්ද්‍රස්ථානයක් ලෙස පැවතීම
(4) නැගෙනහිර හා බටහිර යා කළ සේද මාවත මධ්‍යයේ ශ්‍රී ලංකාව පිහිටා තිබීම

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**23.** ශ්‍රී ලංකා රජය 1981 වසරේ මුස්ලිම් ජාතික නායකයකුට පුරෝගාමියකුට ගෞරව කිරීම සඳහා තැපැල් මුද්දරයක් නිකුත් කළේ ය. ඔහු කවුරුන් ද?
(1) එම්.සී.එම්. කලීල් (2) ටී.බී. ජායා (3) මාක්කාන් මාක්කාර් (4) ඒ.එම්.ඒ. අසීස්

**24.** ස්වාමියා හා බිරිඳගේ බැඳීම පිළිබඳ පැහැදිලි කිරීමට අල්-කුර්ආනය භාවිත කරන පදය වන්නේ,
(1) අස්සිවාජ් ය. (2) අස්සබ්ර් ය. (3) අර්රිස්ක් ය. (4) අස්සකන් ය.

**25.** ගර්භනී කාන්තාවකගේ ඉද්දා කාලවකවානුව කුමක් ද?
(1) දරුවාගේ ප්‍රසූතිය දක්වා වූ කාලයයි. (2) මාස 4 සහ දවස් 10 යි.
(3) මාස 4 යි. (4) මාස් ශුද්ධි තුනක කාලයයි.

**26.** ඉස්ලාමයේ සහ මුස්ලිම්වරුන්ගේ විශේෂත්වය ගෙනහැර දක්වන ලද කවියකු **නොවන්නේ**,
(1) හස්සාන් ඉබ්නු තාබිත් ය. (2) අබ්දුල්ලාහ් ඉබ්නු රවාහා ය.
(3) කෑබ් ඉබ්නු මාලික් ය. (4) ඉම්රඋල් කෙස් ය.

**27.** පහත ඒවායින් අකීදා සම්බන්ධව මුස්ලිම්වරයකුගේ හැසිරීම කෙසේ **නොපැවතිය** යුතු ද?
(1) අල්-කුර්ආනයේ ඇතුළත්වන අකීදා සම්බන්ධ අදහස් තේරුම් ගෙන ක්‍රියා කිරීම
(2) නබිතුමන් ඉගැන්වූ පරිදි අකීදාව එහි මුල් ස්වරූපයෙන් පිළිපැදීම
(3) අකීදා සම්බන්ධ මතභේද ඇති කිරීම ආදියෙන් වැළකී සිටීම
(4) තාර්කික බුද්ධියෙන් පමණක් අකීදා සම්බන්ධ අවබෝධය ලබා ගෙන සම්පූර්ණයෙන් පිළිපැදීම

**28.** පහත ඒවායින් නබිවරුන් සහ රසූල්වරුන්ගේ විශේෂ ගුණාංග ගෙනහැර දක්වන සංරචකය කුමක් ද?
(1) 'ඉස්මත්' යන ගුණය ලබා පාපී ක්‍රියාවලින් සුරක්ෂිත වී සිටීම
(2) ස්වර්ගය සඳහා සුබාසිරි ලබාගත් දසදෙනා ඔවුන් අතර වීම
(3) 'කරාමත්' යන විශේෂත්වය එතුමන්ලාට ලබා දී තිබීම
(4) අල්ලාහ් අණ කළ ක්‍රියාකාරකම්වල නියැළී, ඔහුට කිසිසේත්ම පිටුනොපා සිටීම

**29.** "බිස්මිල්ලාහි තවක්කල්තු අලල්ලාහ්" යන දුආව පරායණය කරන්නේ කුමන අවස්ථාවේ ද?
(1) නින්දෙන් අවදිවන විට (2) මස්ජිදයට පිවිසෙන විට
(3) වැසිකිළියෙන් පිටවන විට (4) නිවසින් පිටවන විට

**30.** "කියාමා දිනයේ මුඃමින්වරයකුගේ තරාදියේ යහගුණාංගවලට වඩා බරින් වැඩි යමක් නොතිබෙනු ඇත." යන ප්‍රකාශය,
(1) අල්-කුර්ආන් වචනයකි. (2) නබි (සල්) තුමාගේ හදීස් වදනකි.
(3) උමර් (රලි) තුමාගේ ප්‍රකාශයකි. (4) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) තුමාගේ ප්‍රකාශයකි.

**31.** පහත ඒවායින් මස්ජිදුල් අක්සා සිද්ධස්ථානයේ සුවිශේෂත්වය වන්නේ,
(1) මහපොළොවේ ප්‍රථමයෙන්ම ගොඩනගන ලද මස්ජිදය වීමයි.
(2) එහි දී ඉටු කරන ලද සලාතයක් සලාත පන්සියයකට සමාන වීමයි.
(3) එය ප්‍රථමයෙන් ආදම් (අලෛ) තුමා විසින් ගොඩනගන ලද්දක් වීමයි.
(4) එය ඉස්ලාමයේ පූජනීයත්වයෙන් දෙවෙනි ස්ථානයේ ඇති මස්ජිදය වීමයි.

**32.** සකාත් ලබාදීමේ දී මුස්ලිම්වරයකු පිළිපැදිය යුතු නිවැරදි පිළිවෙත වන්නේ,
(1) අයෙකු තම රැකවරණය යටතේ ජීවත්වන අයට සකාතය ලබාදීමයි.
(2) අනුමත අවශ්‍යතාවක් සඳහා ණය වූ කෙනෙකුට සකාතය ලබාදීමයි.
(3) යම් වස්තුවක් නිසාබ් තත්ත්වයට පත්වීමට පෙර සකාත් ලබාදීමයි.
(4) යහප්‍රතිඵල උදෙසා රම්ලාන් කාලයේ සකාත් ලබාදීමයි.

**33.** පහත ඒවායින් මූසා (අලෛ) තුමා හා සම්බන්ධ 'කරාමතය' (දිව්‍යමය හාස්කම) කුමක් ද?
(1) දැවෙන ගිනි මැලය සිසිල් පහස ලබා දීම
(2) ගස්වල කොළ නෙළීමට භාවිත කළ සැරයටිය සර්පයකු බවට පත්වීම
(3) ලාදුරු රෝගීන් සුවපත් කිරීම
(4) පුදුම සහගත ලෙස කළු ගල් අතරින් ඔටුවකු මතුවීම

**34.** පහත ඒවායින් 'තව්හීද්' සම්බන්ධ **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) කවරෙකු අල්ලාහ්ට ආදේශයක් තබන්නේ ද ඔහුට ස්වර්ගය තහනම් (හරාම්) ය.
(2) සෑම මුස්ලිම්වරයකුම තව්හීදය අවබෝධ කරගෙන ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වේ.
(3) දේව ධර්ම දූතයන් තව්හීදය පිළිගෙන ජීවත්වන ලෙස මහජනයාට ආරාධනා කරන ලදී.
(4) තව්හීදය නොමැතිව කරන ලද යහක්‍රියාවලට කියාමතයේ ප්‍රතිඵල ලබාදෙනු ලබයි.

**35.** පහත ඒවායින් මුස්ලිම්වරයකුගේ විනය හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) විනෝදය උදෙසාවත් බොරු කීමෙන් වැළකීම
(2) තමා සතුව සාධාරණයට කරුණු තිබියදීත් අනවශ්‍ය තර්ක කිරීම්වලින් වැළකීමට සම්මුතියක් ඇති කර ගැනීම
(3) පොදු ස්ථානවල අනවශ්‍ය ලෙස උස් හඬින් කථා කිරීමෙන් වැළකීම
(4) සවානක බොහෝ දෙනෙකු එකට ආහාර ගන්නා විට, සැම අයෙකු පැත්තකටම අත දිගුකර ආහාර ගැනීම

**36.** පහත ඒවායින් සකාත්හි කොන්දේසිවලට අනුව නිවැරදි පිළිවෙත කුමක් ද?
(1) වැඩිවියට පත් නොවූ දරුවකුගේ වස්තුව පාලනය කරන්නා ඒ වස්තුවට අයත් සකාතය ලබාදීම
(2) ධාන්‍ය, පලතුරු වර්ගවලට අයත් සකාතය ලබාදීමට වසරක් සම්පූර්ණ වන තුරු බලාසිටීම
(3) පොදු දේපළවලට අයත් සකාතය වසර අවසානයේ දී ලබාදීම
(4) ආසන්න වශයෙන් ග්‍රෑම් 85කට සමාන රත්‍රංවලට 1/20 ක් යන ප්‍රමාණයෙන් සකාත් ලබාදීම

**37.** කලා කත්ර් සම්බන්ධයෙන් මුස්ලිම්වරයකුගේ විශ්වාසය කෙසේ විය යුතු ද?
(1) සියල්ල අල්ලාහ්ගේ කැමැත්ත පරිදි සිදු වේ යන විශ්වාසයෙන්, මිනිසාගේ ක්‍රියා නිදහසට අනුව ෂරීආවට අවනත වී ක්‍රියා කිරීම
(2) කලා කත්ර් යනු සම්පූර්ණයෙන් සැඟවී තිබෙන රහසක් හේතුවෙන්, මිනිසාට එයින් තෝරා ගැනීමේ නිදහස නැතැයි විශ්වාස කිරීම
(3) කලා කත්ර් සම්බන්ධ කාරණාවල දී තාර්කික බුද්ධිය පමණක් පදනම් කොට ගෙන තීරණ ගෙන ක්‍රියා කිරීම
(4) මිනිස් ජීවිතයේ ඇතිවන ජය පරාජයන්ට හේතුවන්නේ හුදෙක් මිනිසුන්ගේ ක්‍රියාකලාප යැයි විශ්වාස කිරීම

**38.** පහත සඳහන් වගුවේ '**අ**' තීරුවේ අරාබි වචන කිහිපයක් ද '**ආ**' තීරුවේ ඒවාට අදාළ සිංහල අර්ථ ද දී ඇත.

| | 'අ' | 'ආ' |
|---|---|---|
| (i) | ෂිර්ක් | A - දෙවියන් සහ දෙවියන්ගේ මගපෙන්වීම් ප්‍රතික්ෂේප කිරීම |
| (ii) | කුෆ්ර් | B - අල්ලාහ්ගේ දේවත්වයට යමක් ආදේශ කිරීම |
| (iii) | ඉල්හාද් | C - ඉස්ලාම් දහමෙන් ඉවත් වීම |
| (iv) | රිද්දත් | D - ඉස්ලාමයේ විශ්වාස හා ක්‍රියාකලාප ප්‍රතික්ෂේප කිරීම |

ඉහත '**අ**' තීරුවට අනුව '**ආ**' තීරුව අනුපිළිවෙළට සැකසූ විට නිවැරදි වරණය කුමක් ද?
(1) A, B, C, D (2) A, B, D, C (3) B, A, D, C (4) B, D, A, C

**39.** පහත සඳහන් කරුණු සලකන්න.
A - නියයත් සමඟ ඉහ්රාම් ඇඳීම
B - තල්බියා පරායණය කිරීම
C - අරෆාහි රැඳීම
D - සම් සම් ජලය පානය කිරීම
E - සඊ ඉටු කිරීම
F - හිසකෙස් ඉවත් කිරීම

ඉහත සඳහන් කරුණු අතුරෙන් හජ්හි ෆර්ලු පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, D, E (2) A, B, D, F (3) A, C, E, F (4) B, C, D, F

**40.** පහත වගුවේ සඳහන් නම් සලකන්න.

| | | |
|---|---|---|
| A - අහ්මද් | B - කලීලුල්ලාහ් | C - හාෂිර් |
| D - සිද්දීක් | E - ආකිබ් | F - දූන්නූරෙයින් |
| G - මාහී | H - සෙෆුල්ලාහ් | I - අසදුල්ලාහ් |

ඉහත ඒවායින් මුහම්මද් (සල්) තුමාගේ වෙනත් නම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C, D (2) A, C, E, G (3) B, F, G, H (4) B, G, H, I

* *

PAST PAPERS WIKI

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

**ඉස්ලාම් I, II**
இஸ்லாம் **I, II**
Islam **I, II**

## ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) ඉස්ලාමයේ මූලික නීති මූලාශ්‍ර **දෙක** සඳහන් කරන්න.

(ii) අල්-කුර්ආන් වැකි ප්‍රථමවරට පහළ වූයේ ක්‍රිස්තු වර්ෂ කුමන කාලවකවානුවක ද? කුමන ස්ථානයේ දී ද?

(iii) ඉස්ලාම් දහම ලබා දී ඇති මානව අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න.

(iv) යහගුණ සඳහන් කිරීමට භාවිත කෙරෙන අරාබි පද **දෙකක්** ලියන්න.

(v) සකාත් ලබාගැනීමට **නුසුදුසු** කණ්ඩායම් **දෙකක්** සඳහන් කරන්න.

(vi) හජ් සහ උම්රා යන දෙකටම පොදු අර්කාන් (ෆර්ල්) **දෙකක්** ලියන්න.

(vii) දික්කසාදයේ ප්‍රධාන කොටසක් වන 'කුල්උ' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(viii) ඉස්ලාමයේ ඉබාදත්හි ප්‍රධාන අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

(ix) ඉතිහාසඥ ඉමාම් ඉබ්නු කල්දූන් පවසන ආකාරයට නබි ඉද්රීස් (අලෛ) තුමා සහ නබි නූහ් (අලෛ) තුමා විසින් හඳුන්වා දෙන ලද කර්මාන්ත **දෙක** වෙන වෙනම සඳහන් කරන්න.

(x) කරුණු දෙකක් පදනම් කොටගෙන පිහිට පතන ලෙස අල්-කුර්ආනය අවධාරණය කරයි. ඉබාදත් හා යහගුණාංගවලට සම්බන්ධවන එම කරුණු **දෙක** සඳහන් කරන්න.

**2.** (i) 'සවුම්' යන්න නිර්වචනය කරන්න.

(ii) උපවාසයෙන් ලැබෙන ලෞකික ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න.

(iii) සලාතය නිසි ලෙස ඉටුකරන මිනිසුන් මෙලොව හා පරලොව ලබන ලද ප්‍රතිලාභ **පහක්** පිළිබඳ පැහැදිලි කරන්න.

**3.** (i) ඉස්ලාමය අනුමත කළ ව්‍යාපාර ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඉපයීමේ දී මුස්ලිම්වරයකු වැළකිය යුතු කරුණු **තුනක්** සඳහන් කරන්න.

(iii) ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ සුවිශේෂතා **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**4.** (i) පළමු කලීෆාවරයා ලෙස පත් කරනු ලැබීමට සුදුස්සා අබූබකර් (රලි) තුමා බවට සාධක සපයන සිදුවීම් **දෙකක්** සඳහන් කරන්න.

(ii) දෙමාපියන් රැකබලා ගැනීමේ වැදගත්කම ගැන අල්-කුර්ආන් සහ හදීස් පදනම් කොටගෙන පැහැදිලි කරන්න.

(iii) මුස්ලිම්වරයකුගේ දෛනික ක්‍රියාකාරකම් 'ඉබාදත්' බවට පත්වීමට අනුකූලවන කොන්දේසි පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

5. (i) කිසිම සෙවනක් නැති 'මහ්ෂර්' පිටියේ 'අර්ෂ්' සෙවනේ නැවතී සිටීමට සමහර තරුණයන් අවස්ථාව ලබා ගනී යැයි නබි (සල්) තුමාගේ වදන් පවසයි. නබිතුමා පැහැදිලි කර ඇති පරිදි එවැනි තරුණයින් මෙලොව කුමන ආකාරයේ ගුණාංගවලින් සමන්විත වේ ද?

(ii) නබි (සල්) තුමා දැවාවේ යෙදුනු මුල් කාලවකවානුවේ එතුමන්ට අනුබල දුන් තරුණ සහාබිවරුන් **තිදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(iii) අලි (රලි) තුමා කලීෆා පදවියට තෝරා පත් කිරීමෙන් පසු කිලාෆතයේ ස්ථාවරත්වය රැකගැනීමට ඔහු ගත් ක්ෂණික පියවර **පහක්** සඳහන් කොට, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

6. (i) ජාහිලියියා කාලයේ පැවති ප්‍රසිද්ධ වෙළෙඳපොළ **දෙකක්** සඳහන් කරන්න.

(ii) නබි (සල්) තුමා තම අදහස් ඉදිරිපත් කිරීමට භාවිත කළ සන්නිවේදන මාධ්‍ය ක්‍රම **තුනක්** සඳහන් කරන්න.

(iii) සිද්දි ලෙබ්බෙ මැතිඳුන් ඉටු කළ සමාජ ප්‍රතිසංස්කරණ සේවා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

7. පහත මාතෘකාවලින් ඕනෑම **දෙකක්** ගැන කෙටි සටහන් ලියන්න.

(i) ස්වාභාවික විපත්වල දී මුස්ලිම්වරයකු ඉටුකළ යුතු කාර්යභාරය

(ii) ඉස්ලාමීය දෘෂ්ටිකෝණයෙන් මාධ්‍ය ආචාරධර්ම

(iii) මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර බලපෑම්

(iv) ඉස්ලාමයේ ආහාර ගැනීමේ පුරුදු


***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300





Rs : 300




Rs : 350




Rs : 300




Rs : 300




Rs : 200





Rs : 200





Rs : 200





Rs : 250





Rs : 250





Rs : 200





Rs : 200




Rs : 200





Rs : 300





Rs : 300




Rs : 200




Rs : 200




Rs : 250





Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


# 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY | VISA | mastercard | KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE